Page 2 October 2009.qxd 19/10/2009 19:20 Page 1





ලංකාවිත්ති
LANKA VITHTHI

**LANKA VITHTHI**
**P. O. BOX 64678**
**LONDON NW3 9LS**
**ENGLAND**

*Phone* **: 020 74289388**
*Fax* **: 0871 9005163**
E-mail **: lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor*** **: Daya Ananda Ranasinghe**
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam

# පිටරට අපේ සිංහල දරුවෝ

**දේ**වින්ද ලන්ඩන් නුවර මගේ හිතවත් යුවළක ගේ වැඩිමහල් පුතණුවන් ය. මම ඔහු ඉපදුණු දා සිට දැන සිටිමි. මව්පිය ඇසුරේ ඇතිදැඩි වුණු, විනීත ගති පැවතුම් ඇති දරුවෙකු වන ඔහු උසස් අධ්‍යාපනය ලැබීම පිණිස ලබන සතියේ එංලන්තයේ උතුරු දෙස පෝර්ට්ස්මත් විශ්වවිද්‍යාලය වෙත යන්නේය. "යන්න ඉස්සර වෙලා දේවින්දට පොඩි අවවාදයක් දෙන්න...." ඔහුගේ දෙමාපියෝ මට කීහ.

ළමයෙකුට නොව කිසිම කෙනෙකුට අවවාද දීම මගේ සිරිත නොවේ. අනුන්ට අවවාද දෙනු වෙනුවට මගේ යම් දුර්වලකම් හෝ වැරදි ඇතොත් ඒවා සකසාගැන්ම මගේ සිරිත වෙයි. එහෙත් මෙහිදී මගෙන් කළ ඉල්ලීම මට ඉවත දැමිය නොහැකි විය.

දැනට අවුරුදු 11කට පෙර අප්‍රියෙල් සිංහල අවුරුදු මාසයේදී අප ලන්ඩනයේ ක්‍රිකල්වුඩ් හි දේවස්ථාන ශාලාවේ පැවැත්වූ ලංකාවිත්ති ප්‍රථම සංවත්සර උත්සවය මා මතකයට නැගේ. එකල්හි දේවින්දට වයස අවුරුදු හතක් පමණ වන්නට ඇතැයි සිතමි. උත්සවයට අති විශාල සෙනගක් රැස්ව සිටි අතර ප්‍රධාන අමුත්තන් වූයේ ලන්ඩනයේ එවකට ශ්‍රී ලංකා මහකොමසාරිස්තුමා වූ එස්. කේ. වික්‍රමසිංහ මහතා සහ නියෝජ්‍ය, චිත්‍රාංගනී වාගීශ්වර මහත්මියයි.


එදින ආරම්භයේදී දේවින්ද ලවා සිංහලෙන් කතාවක් කරවූයෙමු. සිංහල කවි පෙළක් ද ඔහු ගායනා කළේ ය. සිංහළ හුරු නැති සිංහළ ළමයි වෙසෙන ලන්ඩනයට එය අතිශය නැවුම් දෙයක් වීය. කිසිදු පැකිලීමක් නැතිව ඔහු එය ඉටු කර අවසන වේදිකාවේ සිටියදී ම විශාල අත්පොලසන් නාදයක් රැස්ව සිටි පිරිසගෙන් ඔහුට ලැබුණු සැටි මට තවම මතක ය.

ඒ කුඩා ළමයා අද උස මහත කඩවසම් තරුණයෙකි. මෑතක පැවති ඔහුගේ **18** වන උපන්දිනයට දෙමාපියෝ ඔහුට මෝටර් රථයක් තෑග්ගක් ලෙස ගෙන දුන්හ. ඔහු ලන්ඩනයෙන් බොහෝ ඈත පෝර්ට්ස්මත් කරා යන්නේ ද ඒ රථයෙනි. මේ සියළු වෙනස්කම්, දැඩිවීම්, උස මහතයෑම් සියල්ල අතරේ දේවින්ද වැනි සිංහළ දරුවන් බහුතරයකගේ සිත් තුළ දෙමාපියන්, වැඩිහිටියන් කෙරෙහි පවත්නා බැඳීම හා අවනත බව මම හොඳින් පසක්කර ඇත්තෙමි. ඔවුන් කියනදේ අහන හොඳ දරුවන්ය. එසේම ඔවුන් දැඩි මහන්සියෙන් ඉගෙනීමේ කටයුතුකර ඉහළ මට්ටමේ රැකියාවන්හි නිරතව සිටිනු දැක්ම ද වැඩිහිටියන් ලෙස අද පිට රටක වෙසෙන අපේ නොමඳ සතුටට හේතුවකි.

දරුවන්ට උගන්වන්නට ශ්‍රීලාංකික දෙමාපියන් විඳින දුක අප කිසිවෙකුට රහසක් නොවේ. සීතළේ ගැහෙන කටුක ජීවිතයකට හැඩ ගැහී දිවා රෑ වෙහෙසී ඒ උපයන සියල්ලම දරුවන් ගේ අධ්‍යාපනය වෙනුවෙන් වැයකරති. ඒ හැර වෙන සැපතක් ඒ දෙමාපියෝ නොදනිති.

තව ටික කලකින් මේ දරුවෝ යන්නට යති. තවත් රටකට, එසේ නැත්නම් මහා බ්‍රිතාන්‍යයේම ඉතා ඈත ප්‍රාන්තයකට. ඔවුන්ගේ දැක්ම ද ඉන් පසු දුෂ්කර වෙනවා ඇත. දේවින්දට අවවාදයක් දෙන්න යයි ඒ දෙමාපියන් කී විට මගේ සිතට ඇතිවූයේ සියුම් දුකකි.

# අඳුරු අප්‍රිකාවට සදහම් එළිය විහිදුවන කළු හාමුදුරුවෝ



**පූජ්‍ය බුද්ධරක්ඛිත හිමි**

**අ**ප්‍රිකා මහාද්වීපය රටවල් 54 කින් යුක්ත අති විශාල ප්‍රදේශයක් වන අතර, එහි ජනගහනය මිලියන 552 කි. උගන්ඩාව නම් රට අයත් වන්නේ නැගෙණහිර අප්‍රිකාවටය. උගන්ඩාව උතුරෙන් සූඩානයෙන්ද දකුණෙන් රුවන්ඩාවෙන්ද බටහිරෙන් කොන්ගෝවෙන් ද වටවූ රටකි. එසේම එය වික්ටෝරියා නම් මහා විල ටැන්සානියාව හා කීනියාව සමග බෙදා හදාගෙන ඇත. පෙර කිසි කලෙක බෞද්ධයෙකු නොසිටි, බුදුදහම ගැන අසා නොතිබුණු උගන්ඩාවේ අද ථෙරවාද බෞද්ධ මධ්‍යස්ථානයක් ඇත. එය ආරම්භ කරන ලද්දේ පූජ්‍ය උගන්ඩාවේ බුද්ධරක්ඛිත ස්වාමීන්වහන්සේ විසිනි. උන්වහන්සේ බුදුදහම වැළඳගෙන අනතුරුව භික්ෂුවක් බවට පත් වූ ප්‍රථම කළු ජාතිකයා විය හැකි ය. එපමණක් ද නොව බුද්ධරක්ඛිත හිමියන්ගේ මෑණියෝ ද බෞද්ධ උපාසිකාවක් වී, දැන් මහණව භික්ෂුණියක්ව සිටින්නී ය. එසේම ඒ හිමියන්ගේ පවුලේ සියල්ලෝම පාහේ උන්වහන්සේ අනුව යමින් අද බෞද්ධයෝ බවට පත්ව සිටිති.

උගන්ඩාව දිළිඳු කුඩා රටකි. එහි ජනගහනය නොයෙක් ගෝත්‍රිකයින්ගෙන් සැදුම් ලද්දේය. කලක් තිස්සේ එම රට යුද්ධයෙන් හා ගෝත්‍රික ගැටුම් වලින්ද, ඉඩි අමීන් වැනි ඒකාධිපති පාලකයින්ගෙන්ද දැඩි ලෙස පීඩා වින්දාය. එහි ජනතාව ඇදහූ ආගම් දෙකකි. ඒ කතෝලික හා ඉස්ලාම් ය.

උගන්ඩාවේ අගනුවර වන කම්පාලා හි 1966 දී උපන් ස්ටීවන් කබෝගෝසා ක්‍රිස්තියානි පවුලකට අයත් ය. ඔහුගේ ළමා කාලයේ බුදු දහම හෝ බුදුන්වහන්සේ ගැන ඒ රටේ ළමයින් දැන සිටියේ නැත. කෙසේ හෝ ළමා කල ස්ටීවන්ගේ සිත ආගමික කටයුතු වලට එතරම් කැමැත්තක් නොවීය. ඔහු ඉරිදාට පල්ලි ගියේ නොගොස් බැරි නිසා ය. එහෙත් පල්ලියේ ගැයූ ගීතිකා සහ කියන කතාන්තර ඔහුගේ සිත් ගත්තේය. පල්ලි නොයන ළමයින්ට පල්ලියේ ස්වාමිගෙන් තරවටුද කෙරිණි. කුඩා ස්ටීවන්ගේ සිත මදින් මඳ ආගමික භක්තියෙන් ඉවත්ව යන්නට විය. මේ බව ඔහුගේ මවට දැනුණි. එහෙත් ඇය කිසිවක් නොකීවා ය.

කුඩා කල නිවසේ තම කාමරයේ තනිව සිටීම ස්ටීවන්ට ප්‍රිය ජනක වූ දෙයකි ඔහු නිහඬව එක් දෙයක් ගැන බොහෝ වෙලා කල්පනා කළේය. මේ පුරුද්ද පසු කලක භාවනා වැඩීම පිණිස ඉවහල් වූ බව ඔහු කියයි. එහෙත් භාවනාව යනු කුමක්ද කියාවත් ඔහු එකල දැන හෝ අසා නැත. වයසින් වැඩෙත්ම ඔහු කතෝලික බෝඩිං පාසැලකට යවන ලදී. කිසිවෙකු ක්‍රිස්තියානි දහමට පට හැනිව සිතන්නේ නම් උගන්ඩාවේ ඔහු හැඳින්වුණේ කළු බැටළුවෙකු හෝ සාතන්ගේ මිත්‍රයෙකු ලෙසටය. ස්ටීවන්ගේ පවුලේ අය අතරේ වුවද පිළිගැන්ම එසේ විය.

1990 දී ස්ටීවන් කබෝගෝසා තරුණයා වැඩිදුර ඉගෙනීම සඳහා ඉන්දියාවේ විශ්වවිද්‍යාලයකට ඇතුල්වීය. ඔහුගේ අවශ්‍යතාව වූයේ ව්‍යාපාරික කළමනාකරණය පිළිබඳව හදාරා උපාධියක් ලැබීම ය. ඔහුගේ ජීවිතය මුළුමනින්ම වෙනස් කළේ ඒ ගමනයි. එම ඉන්දීය ශාස්ත්‍රපීඨයේ බහුතරයක් ඉන්දියානුන් අතර ඔහු වැනි තවත් විදේශික ශිෂ්‍යයෝ ද සුළු පිරිසක් වූහ. ඒ අතර සිටි තරුණ තායිලන්ත භික්ෂූන් දෙනමකි. ඒ දෙදෙන ඉක්මනින් ස්ටීවන්ගේ මිතුරන් බවට පත්විය.

1990 නොවැම්බර් මස ඔහු ඒ එක් තායි භික්ෂුවක් සමග පන්ජාබයේ අගනුවර වූ චන්දිගා හි බෞද්ධ සිද්ධස්ථානයක් නැරඹීමට ගියේය. එහි දැවැන්ත දැකුම්කළු බුදු පිළිමය ස්ටීවන් ගේ සිතේ ඇති කළේ චමත්කාරයකි. පැහැදීමකි. බුදු දහම ගැන ඔහු තුළ ඇල්මක් වැඩී එන්නට වූයේ ඉන් පසුවය. ඒ ඇල්ම තුළින් බුදුදහම ගැඹුරින් හදාරන් නට ඔහුට සිතිණ. ඔහු බුදු දහම ගැන නිතර පොත පත කියෙව්වේය. හැකි හැම විටෙකම සිද්ධස්ථාන නැරඹූයේ ය. ඉන්දියාව පුරා සංචාරයේ යෙදුණේය. ධර්මශාලා වෙතට ගිය දිනෙක දළයිලාමා තුමා හමුවීම විශේෂ සිද්ධියක් වීය. එදින එතුමන් හා අතට අතදී කතා කරන්නට ස්ටීවන්ට ඉඩක් ලැබුණි. තමා කිසිවකට බැඳී නැති නිදහස් මිනිසෙකු ලෙස ද බුදුදහම තුළ කැටිවූ නිදහස ද ඔහුට සැබැවින්ම දැනිණ. විශ්වවිද්‍යාලයේ සිටි කාලයේ ලැබූ හැම නිවාඩුවකදීම ඔහු ධර්මශාලා වෙත ගියේ ය. ඒ එක් වරෙක එහි වූ භාවනා වැඩ සටහනකට සහභාගි වන්නට ඔහුට ප්‍රස්ථාව ලැබිණ. භාවනාව යනු කුමක්ද, ඉන් සිතට දැනෙන අප්‍රමාණ සහනය කොතෙක් ද යන්න ස්ටීවන් දැනගත්තේ එහිදී ය.

ඉගෙනුම අවසන් කළ ඔහු නේපාලයේ සංචාරය කළේය. තායිලන්තයට ගියේය. ඒ ගමනේ දී ස්කූබා කිමිදුම් ක්‍රමය ඉගෙන ගත් ස්ටීවන් කිමිදුම් උපදේශකවරයෙකු ලෙස ධනවත් විදේශික සංචාරකයින් එන මුහුදු වෙරළක රැකියාවක් ද ලැබීය. එහෙත් ඔහු ඉන් සෑහීමට පත්වුණේ නැත. මුදල් උපයන්නට, මුදල් රැස් කරන්නට නොව ඔහුගේ සිත යොමු වී තිබුණේ ජීවිතයේ අධ්‍යාත්මික අංශය වෙතය. ව්‍යාපාරික ලෝකය ගැනත් රැකියාව ගැනත් කළකිරුණු ඔහු සියල්ල හැරදමා තම මව්රට උගන්ඩාවට වෙත පිටත්වූයේය. ඒවන විට ඔහු සිය මව්බිමෙන් බැහැර වී අවුරුදු 7 ක් ඉක්මී තිබුණි.

එහි වැසියෝද, ස්ටීවන්ගේ ගෙදර අයද පුදුමයෙන් බැලූහ. ඔවුන් බලා පොරොත්තුවූයේ පිටරට ගොස් ධනවතෙකු වී මුදල් පුරවාගත් සූට් කේසයක්ද අතැතිව එන කෙනෙකි. එහෙත් මේ තරුණයා ළඟ තිබුණේ බුදුදහම හා භාවනාව ගැන පොත් කීපයක් හා මුදල් සුළු ප්‍රමාණයක් පමණි.

**3 වන පිටුව බලන්න ⟶**

## ✳ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✳

### හිතෝපදේශයෙන්

**ලොකයාත්‍රා භයං ලජ්ජා - දාක්ෂිණ්‍යං ත්‍යාගශීලතා**
**පඤ්ච යත්‍ර න විද්‍යන්තෙ-න කුර්‍ය්‍යාත්තත්‍ර සංස්ථිතිම්**

**අර්ථය** : *ජීවිකාවද, බියද, ලජ්ජාවද, අනුකූලබව හා ත්‍යාග ශීලීබව යන පහ යම් ප්‍රදේශයක නොදක්නා ලැබෙත් ද ඒ දේශයේ විසීම නොකරන්නේ ය.*

**කෙ**නෙකුට යහතින් ජීවත්වීමට හොඳ වටපිටාවක් නොඑසේ නම් හොඳ පරිසරයක් අවශ්‍යය. ඊට අවශ්‍ය කරන සාධක ගැන බොහෝ දෙනෙකුට අවබෝධයක් නැත. සතුටින් සමාදානයෙන් ජීවත්වීමට සිතන්නේ නම් එම සාධක දැන සිටිය යුතුය. ජීවත්වන පරිසරය ගැන අවබෝධයක් නැත්තාට බාධක හා ගැටළු ගලා එනු ඇත. ඊළඟට ඒවාට පිළියම් සෙවීමට වෙහෙස වන නිසා තම අනෙක් කටයුතු අඩාල කරගනී. ඒනිසා අප ජීවත් වන පරිසරය කවර ආකාරයකින් අපට බලපෑම් එල්ල කරන්නේදැයි සැලකිලිමත් විය යුතුය. විශේෂයෙන් දරුවන් සහිත පවුල් මේ ගැන වඩාත් කල්පනාකාරී වීම යෙහෙකි. ළමයි තමා ජීවත්වන පරිසරයෙන් බොහෝ දේ ඉතා ඉක්මනින් උකහා ගනිති.

ලංකාව වැනි රටක ග්‍රාමීය පරිසරයට වඩා නාගරික පරිසරය සංකීර්ණය. ඊටත් වඩා බෙහෙවින් සංකීර්ණ වූවකි ඔබ අප ජීවත්වන මේ බටහිර සමාජය. එයිනුත් ලොව ප්‍රධාන නගරවලින් එකක් වන මෙය වඩාත් සංකීර්ණය. සියගණන් ජාතීන් ජීවත්වන, සිය ගණන් භාෂා හසුරුවන, එපමණක්ම සංස්කෘතීන්ගෙන් ගහණ, නානා ආගම් අදහන මේ විෂම සමාජය නමැති සැඩපහරට හසුනොවී මෙය තරණය කරන්නේ කෙසේද? විශේෂයෙන් තම දූ පුතුන් මින් බේරාගෙන ප්‍රවේශමෙන් එතෙර කරවන්නේ කෙසේද? යන්න දෙමාපියන් බුද්ධිමත්ව කල්පනා කළ යුතුව ඇත.

එසේම මෙම විෂම සමාජ සැඩපහරට අසුවූවෙකු හට තමන්ට අනන්‍ය වූ ආගමක් හෝ දහමක් හෝ භාෂාවක් හෝ සංස්කෘතියක් හෝ නැත යන සිතුවිල්ලෙන් යුතු සියල්ල මිශ්‍ර වූ අමුතුම ආකාරයේ අයද ඔබට මුණ ගැසෙනු ඇත. එම භයානක තත්වයට වගකිව යුත්තේ නොදැනුවත්කම තුළින් එවැනි සමාජ යකට අනුගත වන අහිංසක දරුවන් නොව පුහු ආටෝප පවලින් තම නිසරු බව සරුකර ගන්නට වෑයම් කරන වැඩිහිටියන් ය.

මෙහි පළමුවන කරුණ ලෝක යාත්‍රාවයි. මින් අදහස් කරන්නේ කෙනෙකුට තම ජීවිකා වෘත්තිය පවත්වාගෙන යාමට නිසි පරිසරයක් අවශ්‍ය බවයි. අසහනකාරී පරිසරයක් තුළ එවැන්නක් කිරීම උගහටය. ඊළඟ කාරණාව බුදු දහමේ පවා ලෝක පාලන ධර්ම දෙක ලෙස හඳුන්වන ලැජ්ජා බිය දෙකයි. ලැජ්ජා බිය ආරක්ෂා වන විධියේ වට පිටාවක් තිබිය යුතුය. මෙය මතු පිටින් පෙනෙන අදහසට වඩා ගැඹුරු අර්ථයකින් යුතුව ඉදිරිපත් කොට ඇත. ලැජ්ජා භය දෙකින් තොරව ජීවත්වීමට ඇති පරිසරය ඉතා භයානක වූවකි.

ඊළඟ කාරණා දෙක අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා කෙරෙහි දයාවෙන් කටයුතු කිරීමේ පරිසරයයි. මෙවැනි කාරණා පහකින් පරිපූර්ණ වූ සමාජය, ප්‍රදේශය හෝ පරිසරය කාටත් හිතකරය. සුභදායකය. එවැනි පරිසරයකින් බිහිවන මිනිසා කණාටු වී අකලට මියයන ගසක් මෙන් නොව සාරවත්ව වැඩී ඵල දරණ මහා වෘක්ෂයක් බඳුය.




***රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති***
***♦ පූජ්‍ය විල්ඹයේ විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**



**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**